අධිකරණ අමාත්‍යාංශය

# අයිතිවාසිකම් ප්‍රකාශනය

අත්අඩංගුවේ පසු වන පුද්ගලයෙකුට සපයනු ලැබේ
මත්ද්‍රව්‍ය ජාවාරම සහ ත්‍රස්තවාදය හැරුණු කොට සංවිධානාත්මක අපරාධ සහ අපචාර (ප්‍රංශ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 63-1, 706-73 හා 706-88 වගන්ති)

**පහත තොරතුරු ඔබට වැටහෙන භාෂාවකින් ලබා දිය යුතුය.**
**ඔබ අත්අඩංගුවේ පසු වන කාලය පුරාම මෙම ලේඛනය තබා ගත හැකිය.**

සිරගත කිරීමෙන් දඬුවම් ලැබිය හැකි, සංවිධානාත්මක අපරාධ හෝ අපචාර පාලනය යටතේ ඔබ වරදක් කර හෝ වරදක් කිරීමට උත්සාහ කර ඇති බවට සැක කිරීමට තරම් ඔබට විරුද්ධව පිළිගත හැකි හේතු එකක් හෝ කිහිපයක් ඇති බැවින් ඔබ අත්අඩංගුවේ පසු වන බව ඔබට දන්වනු ලැබේ.

ඔබ සම්බන්ධ චෝදනාවේ යෝග්‍යතාවය, දිනය හා ස්ථානය සහ අත්අඩංගුවේ තබා ගැනීමට හේතු දැන ගැනීමට ඔබට අයිතියක් ඇත.

අත්අඩංගුවේ පසු වන කාලය තුළ පැය 24 ක් දක්වා මෙම කරුණු පිළිබඳව ඔබට දැන ගන්නට ලැබෙනු ඇත.

මෙම කාල සීමාව අවසානයේ දී, රජයේ නීතීඥවරයාට හෝ විමර්ශන විනිසුරුවරයාට භාරකාර කාලය තවත් පැය 24 ක් දක්වා දීර්ඝ කිරීමට තීරණය කළ හැකිය. මෙම මහේස්ත්‍රාත්වරයාට ඔබ ඔහු ඉදිරියට කැඳවන ලෙස නියෝග කළ හැකිය. සුවිශේෂී ලෙස, එසේ විමර්ශනය කිරීමට හෝ විමසීමට අවශ්‍ය නම්, නිදහස සහ භාරකාර විනිසුරුවරයා හෝ විමර්ශන විනිසුරුවරයා විසින් එකක් පැය 24 ක කාලයක් සඳහා වන අමතර දීර්ඝ කිරීම් දෙකක් තීරණය කරනු ලැබිය හැකිය.

කෙසේ වෙතත්, පළමු පැය 48 අවසානයේ දී තවමත් සිදු කිරීමට නියමිත විමර්ශන සඳහා ගත වන කාලය සාධාරණීකරණය කරන්නේ නම්, රජයේ නීතීඥවරයාගේ ඉල්ලීම පරිදි නිදහස සහ භාරකාර විනිසුරුවරයා, නැති නම් විමර්ශන විනිසුරුවරයා විසින් අත්අඩංගුව එක් වරක් පමණක් පැය 48 ක කාලයක් සඳහා දීර්ඝ කිරීමට තීරණය කළ හැකිය.

අත්අඩංගු කාලය අවසානයේ දී, ඔබ රජයේ නීතීඥවරයාගේ හෝ විමර්ශන විනිසුරුවරයාගේ තීරණයකට අනුව මෙම මහේස්ත්‍රාත්වරයා ඉදිරියට ගෙන එනු ඇත. නැති නම් නිදහස් කරනු ඇත. පළමු අවස්ථාවේ දී, ඔබ එදිනම මෙම මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිටිනු ඇත. අධිකරණ සීමාව තුළ විශේෂ පහසුකම් සහිත පරිශ්‍ර තිබේ නම් සහ ඔබගේ අත්අඩංගුව පැය 72 කට වඩා වැඩි කාලයක් නොතිබේ නම්, අත්අඩංගු කාලය අවසන් වීමෙන් උපරිම වශයෙන් පැය 20 ක් ඇතුළත ඔබට ඊළඟ දිනයේ පෙනී සිටිය හැකිය. ඔබගේ අත්අඩංගුව පැය 72 කට වඩා වැඩි කාලයක් පැවතුනේ නම්, මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිටීම ඔබගේ අත්අඩංගු කාලය අවසන් වන දිනයේ සිදු වනු ඇත.

## එපමණක් නොව, පහත දෑ සඳහා ඔබට අයිතියක් ඇති බව ඔබට දන්වනු ලැබේ:

### ඇතැම් පුද්ගලයින්ට දැනුම් දෙන්න

ඔබ සමග සාමාන්‍යයෙන් ජීවත්වන පුද්ගලයෙකු හෝ සෘජුවම ඔබෙන් පැවතෙන ඔබගේ දෙමව්පියන්ගෙන් එක් අයෙකු, හෝ ඔබගේ සහෝදර සහෝදරියන්ගෙන් එක් අයෙකු හෝ ඔබගේ භාරකරු හෝ සුදුසු වැඩිහිටියෙකු වෙත ඔබගේ අත්අඩංගුවට ගැනීමේ නියමය පිළිබඳව දුරකථනයෙන් දැනුම් දෙන ලෙස ඔබට ඉල්ලා සිටිය හැකිය.

ඔබට ඔබගේ සේවායෝජකයාට ද දැනුම් දිය හැකිය.

ඔබ විදේශීය ජාතිකයෙකු නම්, ඔබගේ රටේ කොන්සියුලර් බලධාරීන්ට ද දැනුම් දිය හැකිය.

විසඳිය නොහැකි තත්වයක් නොමැති නම්, ඔබ ඉල්ලීමක් කළ වේලාවේ සිට පැය 3 කට නොඅඩු කාලයක දී මෙම පියවර ගැනෙනු ඇත.

ඔබ නීතිමය රැකවරණය යටතේ සිටී නම්, ඔබගේ රැකබලාගන්නාට, සුදුසු වැඩිහිටියෙකුට හෝ භාරකරුට එම ක්‍රියාමාර්ගය ගැන දැනුම් දෙනු ලැබේ.

කෙසේ වෙතත්, සාක්ෂි එක්රැස් කිරීම හෝ සංරක්ෂණය සඳහා හෝ පුද්ගලයෙකුගේ ජීවිතයට, නිදහසට හෝ අවංකභාවයට බරපතල අනතුරක් වළක්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය නම්, එම නිවේදනය ප්‍රමාද වනු ඇති බවට හෝ නිකුත් නොකෙරෙන බවට රජයේ නීතීඥවරයා (හෝ විමර්ශන විනිසුරුවරයා) විසින් තීරණය කරනු ලැබිය හැකිය. ඔබගේ අත්අඩංගු කාලය පැය 48 ක් ඉක්මවා දීර්ඝ කර තිබේ නම්, එම හේතු නිසාම, නිදහස සහ භාරකාර විනිසුරුවරයා (හෝ විමර්ශන විනිසුරුවරයා) විසින් ඔබගේ ඥාතීන්ට සහ ඔබගේ සේවා යෝජකයාට දැනුම් දීම කල් දැමෙනු ඇත.යම් පුද්ගලයෙකු සමග සන්නිවේදනය කරන්න

ඔබ අත්අඩංගුවේ තබා ඇති බව දැනුම් දිය හැකි පුද්ගලයෙකු සමග ලිඛිතව, දුරකථනයෙන් හෝ සම්මුඛ සාකච්ඡාවක දී සන්නිවේදනය කිරීම සඳහා ඉල්ලීමක් කිරීමට ඔබට හැකිය.

අත්අඩංගුවේ තබා ගැනීමට ඇති හේතු සමග නොගැලපේ නම් හෝ වරදක් සිදු වීමට ඉඩ තිබේ නම් ඔබගේ විමර්ශන නිලධාරියාට ඔබගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැකිය. මෙම සන්නිවේදනයේ වේලාව, කොන්දේසි සහ කාල සීමාව එකී නිලධාරියා විසින් තීරණය කරනු ලබන අතර, එය මිනිත්තු 30 නොඉක්මවිය යුතුය; එය සිදු වන්නේ නිලධාරියාගේ හෝ එම නිලධාරියා විසින් පත් කරන ලද පුද්ගලයකුගේ පාලනය යටතේය.

ඔබගේ අත්අඩංගු කාලය පැය 48 ඉක්මවා තිබේ නම්, කොන්සියුලර් බලධාරීන් සමග සන්නිවේදනය කිරීම සඳහා වන ඔබගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට විමර්ශන නිලධාරියාට නොහැකිය.

## වෛද්‍යවරයෙකු ලවා පරීක්ෂා කර ගන්න.

අත්අඩංගුවට පත් කාල පරිච්ඡේදයේ ආරම්භයේ සිටම සහ නියමය දීර්ඝ කිරීමේ අවස්ථාවක දී වෛද්‍යවරයකු විසින් පරීක්ෂා කරන ලෙස ඔබට ඉල්ලා සිටිය හැකිය. ඔබගේ අත්අඩංගු කාලය පැය 48 ඉක්මවා ඇත්නම්, ඔබ වෛද්‍යවරයකු විසින් පරීක්ෂා කළ යුතු අතර අළුතෙන් වෛද්‍ය පරීක්ෂණයක් ඉල්ලා සිටීමට ඔබට ඇති අයිතිය පිළිබඳව ඔබට උපදෙස් දෙනු ලැබේ.

ඔබ නීතිමය ආරක්ෂණ පියවරකට යටත් වන්නේ නම්, ඔබගේ රැකබලාගන්නාට, සුදුසු වැඩිහිටියෙකු හෝ භාරකරුට ඔබ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරන ලෙස ඉල්ලා සිටිය හැකිය.

## ප්‍රකාශ කරන්න, ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න, නැති නම් නිහඬව සිටින්න.

ඔබගේ අනන්‍යතාවය තහවුරු කළ පසු, ඔබගේ නඩු විභාගයේ දී ඔබට පහත සඳහන් දේවල් සඳහා අයිතියක් ඇත.

- ප්‍රකාශ නිකුත් කිරීම,

- ඔබෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දීම,

- හෝ නිශ්ශබ්දව සිටීම.

## නීතිඥයෙකුගේ සහාය ලබා ගන්න

### නීතිඥයෙකු තේරීම

ඔබ අත්අඩංගුවේ රඳවා තිබීම ආරම්භයේ සිට, ඕනෑම වේලාවක නඩු විභාගයක් අතරතුර, සහ අත්අඩංගුව දීර්ඝ වන අවස්ථාවක් වුවහොත් - එම දීර්ඝ කිරීම ආරම්භයේ සිට - ඔබ කැමති නීතිඥයෙකුගේ සහාය ඔබට ඉල්ලා සිටිය හැකිය. ඔබට නීතිඥයෙකු පත් කර ගැනීමට නොහැකි නම් හෝ තෝරා ගත් නීතිඥයා සම්බන්ධ කර ගත නොහැකි නම්, ස්වයංක්‍රීයව නීතිඥයෙකු පවරා දෙන ලෙස ඉල්ලා සිටීමට ඔබට හැකිය.

ඔබ සම්බන්ධ කර ගත් අයෙකු විසින් ද ඔබගේ නීතිඥයා පත් කළ හැකිය. මෙම අවස්ථාවේ දී, නීතිඥයා පත් කිරීම ඔබ විසින් තහවුරු කළ යුතුය.

ඔබ නෛතික ආරක්ෂණ පියවරකට යටත් නම්, ඔබගේ රැකබලාගන්නා, සුදුසු වැඩිහිටියෙකු හෝ භාරකාරයා විසින් නීතිඥයෙකු පත් කරනු ලැබිය හැකිය; නැති නම් එසේ පත් කරන ලෙස නීතිඥ සංගමයේ සභාපතිවරයාගෙන් ඉල්ලා සිටිය හැකිය.

### නීති ආධාර

සම්මුඛ පරීක්ෂණයේ රහස්‍යභාවය සහතික කරන කොන්දේසි යටතේ නීතිඥවරයාට විනාඩි 30 ක් ඔබ හමු විය හැකිය. අත්අඩංගුව දීර්ඝ කිරීමක දී, ඔබට නැවත ඔබගේ නීතිඥවරයා හමු වීමට ඉල්ලා සිටිය හැකිය.
ඔබගේ ඉල්ලීම පරිදි නීතිඥවරයාට ඔබ සහභාගී වන නඩු විභාග, වාදවිවාද, ප්‍රතිනිර්මාණ හෝ හඳුනා ගැනීමේ පෑළිවලට සහභාගි විය හැකිය.

### ප්‍රතිචාර කාලය

ක්ෂණික නඩු විභාගයක් අවශ්‍ය වන විමර්ශනයේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන, ඔබගේ නීතිඥවරයා පැමිණීමට නියමිත පැය 2 ක කාල සීමාව ඉකුත් වන තුරු බලා නොසිට, ලිඛිත හා තර්කානුකූල තීන්දුවක් මගින් නඩු විභාගය ආරම්භ කිරීමට බලය පැවරීමට රජයේ නීතීඥයාට හෝ විමර්ශන විනිසුරුවරයාට හැකිය.

බලවත් හේතු ඇති විට රජයේ නීතිඥවරයාගේ, නිදහස හා භාරකාර විනිසුරුවරයාගේ හෝ විමර්ශන විනිසුරුවරයාගේ තීරණයකින් ඔබගේ නීතිඥවරයාගේ මැදිහත්වීම උපරිම කාලය පැය 48 ක් දක්වා කල් දැමිය හැකිය.

## භාෂණ පරිවර්තකයෙකුගේ සහාය ලබා ගන්න

ඔබ ප්‍රංශ භාෂාව කථා නොකරන්නේ නම් හෝ තේරුම් නොගන්නේ නම්, ඔබගේ නඩු විභාගයේ දී සහ ඔබගේ නීතිඥවරයා සමග සන්නිවේදනය කිරීමේ දී භාෂණ පරිවර්තකයෙකුගේ සහාය නොමිලේ ලබා ගැනීමේ අයිතියක් ඔබට ඇත.

## අත්අඩංගුව අවසන් කිරීම සඳහා අදහස් දක්වන්න

මෙම මහේස්ත්‍රාත්වරයා අත්අඩංගුව දීර්ඝ කිරීමට තීරණය කළ විට එම පියවර අවසන් කිරීමට උත්සාහ කිරීම උදෙසා ඔබට රජයේ නීතීඥවරයාට හෝ විමර්ශන විනිසුරුවරයාට කරුණු දැක්විය හැකිය.

## ඔබගේ නඩුවට අදාල ඇතැම් කාරණාවලට යොමු වන්න

ඔබගේ හෝ ඔබගේ නීතිඥයාගේ ඉල්ලීම පරිදි සහ අත්අඩංගුව දීර්ඝ කිරීමට පෙර අවස්ථාවේ දී උපදෙස් ලබා ගැනීමට ඔබට මේ දේවල් ඉල්ලා සිටිය හැකිය:

- ඔබ අත්අඩංගුවට ගැනීම පිළිබඳ දැන්වීම;

- ඔබ පරීක්ෂා කළ වෛද්‍යවරයා විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකය.

- ඔබගේ නඩු විභාගයේ සටහන්.

## රජයේ නීතීඥවරයාට අදහස් දක්වන්න

අත්අඩංගු කාලය අවසන් වී වසරකට පසු, ලැබුණු බවට රිසිට් පතක් සහිත ලියාපදිංචි ලිපියක් මගින් හෝ ලිපිකරුගේ කාර්යාලයට ප්‍රකාශයක් නිකුත් කිරීමෙන්, නිරීක්ෂණ ලබා ගැනීම සඳහා නඩු ගොනුව බැලීම පිණිස රජයේ නීතීඥවරයාගෙන් විමසීමක් කළ හැකිය.